2018.02.21

සහෝදර සාමාජික සාමාජිකාවනි,

## 71 වන වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ නිවේදනය

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ 71 වන වාර්ෂික මහා සභා රැස්වීම 2018 මාර්තු මස 25 වෙනිදා ඉරිදා පෙ.ව. 9.00 ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වේ. නියමිත වේලාවට මෙම රැස්වීමට සහභාගී වන ලෙස සාමාජික ඔබට ගෞරවයෙන් ඇරයුම් කරමු.

එදින න්‍යාය පත්‍රය

- පන්සිල් ගැනීම සහ දම්පල් පිළිරුවට උපහාර දැක්වීම.
- අනගාරික ධර්මපාලතුමා, මියගිය විදුහල්පතිවරුන්, ගුරුභවතුන් ආදි සිසුන් හා රණවිරුවන් සිහි කිරීම.
- පාසල් ගීය ගායනා කිරීම.
- පිළිගැනීමේ කථාව.- ගරු විධායක සභාපති
- පසුගිය සංවත්සරික මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.
- 2017/2018 වර්ෂයේ ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම.
- 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම සහ සභා සම්මත කිරීම.
- ගරු විදුහල්පතිතුමාගේ කතාව.
- සාමාජිකත්වය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත යෝජනා සහ ලිපි සභාවට ඉදිරිපත් කිරීම. (ලිඛිත යෝජනා භර ගැනීමේ අවසන් දිනය (පෙබරවාරි 16) වනවිට ලිඛිත යෝජනා කිසිවක් ලැබී නොතිබිණි.)
- ව්‍යවස්ථාවේ 13.1.10 වගන්තිය සංශෝධනය කිරීම සඳහා සාමාජික අනුමැතිය ලබාගැනීම.
- විධායක සභාව ඉල්ලා අස්වීම.
- 2018/2019 පාලන වර්ෂය සඳහා විධායක සභාව පත් කිරීම.
  ***(ව්‍යවස්ථාවේ 19.7 වගන්තිය අනුව විධායක සභාව තෝරා පත් කරගන්නා අවස්ථාවේදී අපේක්ෂකයා අනිවාර්යයෙන්ම සභා ගැබේ රැඳී සිටිය යුතුය).***
- *අනුශාසක මණ්ඩලය පත්කිරීම.*
- *විනය පරීක්ෂණ මණ්ඩලය පත්කිරීම.*
- විගණකවරයෙකු පත් කිරීම.
- සාමාජික අදහස් දැක්වීම.
- නව විධායක සභාපතිතුමාගේ කථාව.
- නව ලේකම්තුමාගේ ස්තුති කථාව.

මෙයට

විධායක සභාවේ අණ පරිදි



චාන්දනී ආර්. වේරගල

ගරු ප්‍රධාන ලේකම්

සැලකිය යුතුයි :-

- යාවජීව සාමාජික හැඳුනුම්පත් ලබා ගෙන ඇති සියලුම සාමාජිකයින් රැස්වීමට පැමිණෙන විට එම හැඳුනුම්පත රැගෙන එන ලෙසත්, හැඳුනුම්පත් නොමැති සාමාජිකයින් තම සාමාජික අංකය (යාවජීව හෝ සාමාන්‍ය) මතක තබා ගෙන එන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.
- පැමිණීමේ ලේඛනය අත්සන් කරන අවස්ථාවේදී සාමාජික අංකය තහවුරු කිරීමට අපොහොසත් වුවහොත් ඡන්ද පත්‍රිකා ලබාදීමට නොහැකි වනු ඇත.

**අමුණුම්**

I. ව්‍යවස්ථාවෙන් උපුටා ගැනීම්
II. ඉදිරි වසර සඳහා නාම යෝජනා ඉදිරිපත් කර ඇති සාමාජිකයින්ගේ නාම ලේඛනය
III. අනුශාසක මණ්ඩලය හා විනය පරීක්ෂණ මණ්ඩලය සඳහා විධායක සභාව මගින් නිර්දේශිත නාම ලේඛනය

★ වාර්ෂික ගිණුම් වාර්තා මාර්තු මස 21 වැනි දින www.dharmapalappa.lk වෙබ් අඩවියට ඇතුලු කරනු ඇත.